සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

විභාග අංකයඃ ..................................... **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** **කාලය පැය 02 යි**

- **අංක 01 - 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරා (×) ලකුණ යොදන්න.**

(01) සන්නිවේදන අධ්‍යයනය විෂය විධිමත් පාඨමාලාවක් ලෙස ශ්‍රී ලංකාවේ පළමු වරට ආරම්භ කර ඇත්තේ,
(1) කැළණිය විශ්ව විද්‍යාලයේ ය.
(2) ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ය.
(3) කොළඹ විශ්ව විද්‍යාලයයේ ය.
(4) දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලයේ ය.
(5) පෙන්සෙල්වේනියානු විශ්ව විද්‍යාලයේ ය.

(02) සන්නිවේදනය තුළින් මානව සබඳතා ඇතිකර ගත හැකි බවත් කාලය අවකාශය දුර ජයගත හැකි බවත් සිය නිර්වචනය තුළින් ඉදිරිපත් කළේ,
(1) විල්බර් ග්‍රාම් ය.
(2) ෂැනොන් හා වීවර් ය.
(3) චාල්ස් කුලී ය.
(4) ඔස්ගුඩ් හා ග්‍රාම් ය.
(5) මාෂල් මැක්ලූහන් ය.

(03) 'ජනතාව හා ඔවුන්ගේ ගැටලු' කෘතිය සම්පාදනය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) චාල්ස් හෝල්ටන් කුලී ය.
(2) වෝල්ටර් ලිප්මාන් ය.
(3) ජෝන් ඩුවී ය.
(4) විල්බර් ග්‍රාම් ය.
(5) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.

(04) 'තෝඩර්පාඩල්'යන්නෙහි අර්ථය වන්නේ,
(1) මැනවින් දැනුම් දීමයි
(2) පොදු බවට පත් කිරීමයි.
(3) තොරතුරු හුවමාරු කිරීමයි.
(4) දැනගත් දේ දැනගැනීමට සැලැස්වීමයි.
(5) සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලියයි.

(05) සන්නිවේදක ග්‍රාහක භූමිකා අතර සන්නිවේදන ක්‍රියාවලිය ඵලදායිව සිදුවීමට වැදගත් වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
(1) අත්දැකීම් පසුතලයයි.
(2) ප්‍රතිපෝෂණයයි.
(3) තොරතුරු මූලාශ්‍රයයි.
(4) නාලිකාවයි.
(5) සන්දේශයයි.

(06) ජන සන්නිවේදනයට සුවිශේෂී වූ කාර්ය භාරයන් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න,

(1) සුපරීක්ෂණය, අර්ථකථනය, සහසම්බන්ධතාව, සමාජානුයෝජනය

(2) තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, විනෝදාස්වාදය, පෙළඹවීම

(3) සුපරීක්ෂණය, සමාජානුයෝජනය, පෙළඹවීම, අර්ථකථනය

(4) තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, ජාතික ඒකාබද්ධතාවය, පෙළඹවීම

(5) සුපරීක්ෂණය, ප්‍රජානනය, අපසරණය, සමාජානුයෝජනය.

(07) මානව සන්නිවේදනයේ බිහිවූ මුල්ම සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) දෘශ්‍ය සන්නිවේදනය යි. (2) නිර්වාචික සන්නිවේදනය යි.

(3) වාචික සන්නිවේදනය යි. (4) අවිධිමත් සන්නිවේදනය යි.

(5) ශ්‍රව්‍ය සන්නිවේදනය යි.

(08) රූපවාහිනී ටෙලි නාට්‍යයක් නරඹමින් සිටි දමිඳුනිට එක්වරම විදුලිය විසන්ධි වීම නිසා එහි කොටසක් නැරඹීමට නොහැකි විය. මෙම අවස්ථාව නිරූපණය කරන සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කර ඇත්තේ,

(1) ෂැනොන් හා විවර් ය. (2) හැරල්ඩ් ඩී ලැස්වේල් ය. (3) ඇරිස්ටෝටල් ය.

(4) ශ්‍රාම් හා ඔස්ගුඩ් ය. (5) චාල්ස් කූලීය.

(09) දීර්ඝ කාලයකට පසු තම නිවසට පැමිණි සොහොයුරා දුටු කමල් ගේ මව තම පුතණුවන්ට මාමා පැමිණ ඇති බව දැඩි සතුටින් කීවාය. එහෙත් කමල් ඇසිපිය නො හෙළා රූපවාහිනිය දෙස බලා සිටියේය මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ඍජුවම රූපවාහිනිය බලපා ඇති බව සිය පර්යේෂණය මගින් ඉදිරිපත් කරනු ලැබූයේ,

(1) පෙන්සෙල්වේනියානු විශ්ව විද්‍යාලය ය.

(2) ගෘෘන්වල්ට් ප්‍රකාශනය ය.

(3) යුනෙස්කෝ සංවිධානය ය.

(4) විල්බර් ශ්‍රාම්ය ය.

(5) ඉලිනොයිස් විශ්ව විද්‍යාලය ය.

(10) වාහන බලපත්‍රයක් ලබාගැනීම සඳහා රියැදුරු පාසලකට ගිය ෂනාල්ට වාහන පැදවීමේ නීති රීති පිළිබඳ අවබෝධයක් ලබා දෙන ලදී. සන්නිවේදන කාර්යයන් ට අනුව මෙහිදී සිදු වන්නේ.

(1) උපදෙස් සම්පාදනය යි. (2) තොරතුරු සම්පාදනය යි.

(3) පෙළඹවීමයි. (4) සමාජානුයෝජනයයි.

(5) මතවාදී කාර්යයි.

(11) ව්‍යාපාරිකයෙකු වූ සුමිත්ට සිය ව්‍යාපාර කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට සම්බන්ධ විය හැකි සන්නිවේදන ප්‍රභේදය වන්නේ,

(1) ජනසන්නිවේදනයයි. (2) වාචික සන්නිවේදනයයි.

(3) අතථ්‍ය සන්නිවේදනයයි. (4) පුද්ගලාන්තර සන්නිවේදනයයි.

(5) මහජන සන්නිවේදනයයි.

(12) මාධ්‍ය පිළිබඳව ඉගෙනීම, මාධ්‍යයේ ස්වභාවය, අන්තර්ගතය, ඓතිහාසික පරිණාමය ආදී විෂය කොටස් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබෙන්නේ,

(1) සන්නිවේදනය යන විෂය කොටසෙනි. (2) සංස්කෘතිය යන විෂය කොටසෙනි.

(3) සාක්ෂරතාවය යන විෂය කොටසෙනි. (4) මාධ්‍ය අධ්‍යයනය යන විෂය කොටසෙනි.

(5) නිර්මාණාත්මක සන්නිවේදනය යන විෂය කොටසෙනි.

(13) Many Voices One World කෘතිය රචනා කරනු ලැබූයේ,

(1) මාකර්ස් පර්සියස් ය. (2) චාර්ල්ස් ප්ලැකාඩ් ය.

(3) යුනෙස්කෝ සංවිධානය ය. (4) ආහාර හා කෘෂිකර්ම සංවිධානය ය.

(5) අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතනය ය.

(14) දුරකථන සමාගමක් විසින් පොදුවේ ග්‍රාහක ජංගම දුරකථනය වෙත කෙටි පණිවිඩ ලබාදීම සන්නිවේදනයේ ස්වභාවයට අනුව,

(1) ප්‍රතිපෝෂණ අවස්ථාවකි.

(2) ද්විමාර්ගික සන්නිවේදන අවස්ථාවකි.

(3) තොරතුරු සම්පාදන අවස්ථාවකි.

(4) තොරතුරු විකේතකරණ අවස්ථාවකි.

(5) ඒකමාර්ගික සන්නිවේදන අවස්ථාවකි.

(15) ග්‍රාහකයා මාධ්‍ය හරහා ලැබෙන සංදේශ පෙරහනු වලට භාජනය කරන්නේ,

(1) තම අත්දැකීම් පසුතලයට අනුවයි. (2) ජනමාධ්‍යයේ බලපෑම අනුවයි.

(3) දොරටුපාල ක්‍රියාවලිය අනුවයි. (4) නියාමන ක්‍රියාවලිය අනුවයි.

(5) මාධ්‍ය විස්තාරණය ට අනුවයි.

(16) වෘත්තීය දැනුමෙන් යුතු පුද්ගලයින් සමග ජාල ගොඩනැංවීමට යොදා ගත හැකි සමාජ මාධ්‍යයක් වන්නේ,

(1) Skype (2) Viber

(3) Twitter (4) Printerest

(5) Linkedin

(17) ටිම් බර්නස් ලී විසින් ඉදිරිපත් කළ අදහසක් වන්නේ,

(1) විශ්ව ගම්මාන සංකල්පයයි. (2) චන්ද්‍රිකා තාක්ෂණයයි.

(3) ලෝක ව්‍යාප්ත ජාලයයි. (4) අංකිතකරණ තාක්ෂණයයි.

(5) මුහුණු පොතයි.

(18) වර්තමානයේ ශ්‍රී ලංකාවේ සන්නිවේදනය විෂය ඉගැන්වීම සිදු කරන විශ්ව විද්‍යාලයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

(1) රජරට විශ්ව විද්‍යාලය (2) යාපනය විශ්ව විද්‍යාලය (3) කොළඹ විශ්ව විද්‍යාලය

(4) පේරාදෙණිය විශ්ව විද්‍යාලය (5) විවෘත විශ්ව විද්‍යාලය

(19) ලේඛනයේ ආරම්භය නිසා ඇති වූ වඩාත් වැදගත් කරුණ වන්නේ,

(1) තොරතුරු හුවමාරු කරගත හැකි වීම.

(2) පුළුල් ග්‍රාහක පිරිසක් වෙත සංදේශ ලබා දිය හැකි වීම.

(3) අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කර තබා ගත හැකි වීම

(4) සංකීර්ණ අදහස් ප්‍රකාශ කළ හැකිවීම.

(5) අදහස් හා සංකල්ප පුළුල් වීම.

(20) පහත සන්නිවේදන වර්ග හා ප්‍රයෝජන පිළිබඳ අවධානය යොමු කරන්න.

(1) අන්තර්පුද්ගල සන්නිවේදනය. A - පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කරයි

(2) ජන සන්නිවේදනය. B - වඩාත් තිව්‍ර සන්නිවේදනයකට අවකාශ සලසයි

(3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය. C - ප්‍රතිරූප ගොඩ නගයි

(4) සමූහ සන්නිවේදනය. D - නිර්මාණශීලීත්වය වර්ධනය කරයි

(5) මහජන සන්නිවේදනය. E-සහසම්බන්ධතා කාර්යය ඉටු කරයි.

ඉහත සන්නිවේදන වර්ග හා ප්‍රයෝජන නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 1- D, 2 - C, 3 -B, 4 - A, 5 -E-

(2) 1- B, 2 - E, 3 -D, 4 - A, 5-C -

(3) 1- A, 2 - C, 3 -D, 4 - B, 5 -E-

(4) 1- E, 2 - A, 3 -C, 4 - D, 5-B -

(5) 5- C, 2 - B, 3 -F, 4 - A, 5 -D-

(21) සමාධි හෂිනිකා සමග දුරකථනයෙන් කතා කරමින් සිටින විට එක්වරම දුරකථනය විසන්ධි විය.මෙම ස්වභාවය විස්තර කළ හැකි සන්නිවේදන මූලිකාංගය වන්නේ,

(1) සංදේශයයි. (2) අග්‍රස්ථානයයි.
(3) සන්දර්භයයි (4) බාධකයි
(5) ප්‍රතිපෝෂණයයි.

(22) ගෝලීයකරණය පදනම් වී ඇත්තේ,

(1) මාක්ස්වාදී දෘෂ්ටිකෝණයට අනුව ය.
(2) ෆැසිස්ට්වාදී දෘෂ්ටිකෝණයට අනුව ය.
(3) ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටිකෝණයට අනුව ය.
(4) නව ලිබරල් වාදී දෘෂ්ටිකෝණයට අනුව ය.
(5) ඒකාධිපතිවාදී දෘෂ්ටිකෝණයට අනුව ය.

(23) අන්‍යෝන්‍ය ලෙස ක්‍රියා කරන සංරචකයක් නොවන්නේ,

(1) පුද්ගලයා යි. (2) සමාජය යි. (3) සංස්කෘතිය යි.
(4) සන්නිවේදනය යි. (5) දේශපාලනය යි.

(24) වර්තමාන රූපවාහිනී ටෙලි නාට්‍ය නැරඹීමට උසස් බුද්ධි මට්ටමක් හෝ උගත්කමක් අවශ්‍ය නොවන බවත්, ඕනෑම අයකුට නරඹා අවබෝධ කර ගැනීම පහසු බවත් බොහෝ දෙනාගේ අදහසයි. එවැනි නිර්මාණ ඇතුළත් සංස්කෘතික ප්‍රභේදය වන්නේ,

(1) ජනප්‍රිය සංස්කෘතියයි. (2) මාධ්‍ය සංස්කෘතියයි.
(3) ජන සංස්කෘතියයි. (4) සම්ප්‍රදායික සංස්කෘතියයි.
(5) නව මාධ්‍ය සංස්කෘතියයි.

(25) මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳ යුරෝපා කොමිසම මඟින් ඉදිරිපත් කරන ලද නිර්වචනය තුළ ඇතුළත් කරුණක් නොවන්නේ,

(1) ප්‍රවේශ වීමයි. (2) ඇගයීමයි. (3) නිර්මාණය යි.
(4) පරිහරණය යි. (5) විශ්ලේෂණය යි.

(26) දමිත්‍රි තමාගේ අවසාන අරමුණු හා ඉලක්කයන් පිළිබඳව අවබෝධයෙන් යුතුව මාධ්‍ය පරිහරණය කරයි. ඒ සඳහා ඇයට උපකාර වී ඇත්තේ,

(1) ඥාන ව්‍යුහය යි. (2) ස්වකේන්ද්‍රය යි. (3) කුසලතාවය යි.
(4) සංජානනය යි. (5) පරිකල්පනය යි.

(27) කරපිංචා බොහෝ රෝගවලට ඖෂධයක් බව බොහෝ දෙනා පවසති. මෙම තොරතුර,

(1) තථ්‍ය තොරතුරකි. (2) පාරිසරික තොරතුරකි.
(3) සමාජීය තොරතුරකි. (4) නිල ලත් තොරතුරකි.
(5) සංජානන තොරතුරකි.

(28) මාධ්‍ය සංස්කෘතික සංසරණයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ,

(1) මාධ්‍ය අධ්‍යාපනයයි. (2) මාධ්‍යයේ ව්‍යාප්තියයි.
(3) ආර්ථික ක්‍රියාවලියයි. (4) සමාජ ගතිකත්වයයි.
(5) සමාජ දේශපාලන ක්‍රියාවලියයි.

(29) අන්තර් සංස්කෘතික අධ්‍යයනය යනු,

(1) විවිධ සංස්කෘතීන් පිළිබඳ දැනගැනීමේ කුතුහලයයි.
(2) අන්‍ය සංස්කෘතීන් අනුකරණයයි.
(3) මාධ්‍ය සංස්කෘතිය විසින් සමකාලීන සමාජය තුළ ඉටු කරන කාර්යයයි.
(4) ජාත්‍යන්තර මාධ්‍ය පිළිබඳව පවතින අවබෝධයයි.
(5) විවිධ ජාතික සංස්කෘතීන් වලට අයත් දෙපාර්ශ්වයක් අතර ඇතිවන අන්‍යෝන්‍ය අවබෝධය යි.

(30) මාධ්‍ය සාක්ෂරතාවය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

P - මාධ්‍ය සාක්ෂරතාවයේ පදනම වන්නේ ලිවීමේ හා කියවීමේ නිපුණතාවයයි.

Q - ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන විවිධ සංදේශ තේරුම් ගෙන පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාව යයි.

R - මාධ්‍ය සාක්ෂරතාවය අදාළ වන්නේ රූපවාහිනී මාධ්‍ය සම්බන්ධයෙනි.

S - සන්දේශ නිර්මාණය හා විශ්ලේෂණය මාධ්‍ය සාක්ෂරතාවේ ප්‍රධාන අංග වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) P පමණක් සත්‍යය වේ. (2) S පමණක් සත්‍යය වේ.
(3) P හා R අසත්‍යය නමුත් Q,S සත්‍යය වේ. (4) R හා Q සත්‍යය නමුත් P,S අසත්‍යය වේ.
(5) Q හා S සත්‍යය නමුත් P,R අසත්‍යය වේ.

(31) එක්තරා දේශපාලනඥයෙක් විසින් අඩු ආදායම් ලාභීන්ට සහනාධාර මලු ලබාදුන් ආකාරය ඡායාරූප සහිතව පුවත්පතක පළ කර තිබිණි. මෙම සිදුවීමෙහි යථාර්ථය හඳුනා ගැනීමට නම් කළ යුත්තේ එම සංදේශය,

(1) සංස්ලේෂණය කිරීමයි. (2) කාණ්ඩකරණය කිරීමයි. (3) ඇගයීමයි.
(4) විශ්ලේෂණය කිරීමයි. (5) වියුක්තිකරණය කිරීමයි.

(32) සන්නිවේදන අවස්ථාවකදී වැදගත් විය හැකි සාධකයක් වීමට අවම ඉඩක් ඇත්තේ,

(1) ප්‍රකාශ කරන ලද කරුණු ය. (2) සන්නිවේදකයාගේ තරාතිරම ය.
(3) යටපත් කරන ලද කරුණු ය. (4) සන්නිවේදකයාගේ නිර්වාචික හැසිරීම ය.
(5) ප්‍රකාශිත කරුණුවල පරස්පරතා ය.

(33) සිතෙහි ඇතිවන අදහස් කේත උපයෝගී කරගනිමින් සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියත්, සන්දේශයක අන්තර්ගතය අර්ථකථනය කර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය පිළිවෙලින් හඳුන්වන්නේ,

(1) ආකේතකරණය හා විකේතකරණය ලෙසය. (2) විකේතකරණය හා ආකේතකරණය ලෙසය.
(3) ආකේතකරණය හා විකේතකරණය ලෙසය. (4) විකේතකරණය හා ආකේතකරණය ලෙසය.
(5) ආකේතකරණය හා සංජානනය ලෙසය.

• 34 - 37 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න

| | | |
|---|---|---|
| A - සන්නිවේදකයා | E - බලපෑම | I - දොරටුපාලකයෝ |
| B - අග්‍රස්ථානය | F - ග්‍රාහකයා | J - නියාමකයෝ |
| C - සංදේශය | G - ප්‍රතිපෝෂණය | K - අත්දැකීම් පසුතලය |
| D - තොරතුරු මූලාශ්‍රය | H - ඝෝෂා | L - සන්දර්භය |

(34) ෂැනෝන් හා වීවර් ආකෘතියේ අන්තර්ගත සන්නිවේදන මූලිකාංග ඇතුළත් වරනය තෝරන්න

(1) A, B, C, E, F (2) B, C, D, F, H
(3) A, C, D, G, H (4) B, C, E, F, H
(5) B, C, D, F, G

(35) ග්‍රාහකයාගේ ආකල්ප හා චර්යාව වෙනස් කිරීමට බලපාන සාධකය වන්නේ,

(1) A ය. (2) C ය. (3) D ය.
(4) E ය. (5) G ය.

(36) HUB ආකෘතිය තුළ පමණක් අන්තර්ගත සන්නිවේදන මූලිකාංග දෙකක් වන්නේ,

(1) A හා E ය. (2) A හා C ය. (3) I හා J ය.
(4) F හා J ය. (5) D හා J ය.

(37) මෙහි F සිට A දක්වා C ගමන් කළේ නම් එය හැඳින්විය යුතු වන්නේ,

(1) B ලෙස ය. (2) D ලෙස ය. (3) E ලෙස ය.
(4) G ලෙස ය. (5) H ලෙස ය.

(38) සන්නිවේදන ස්වරූප සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සදොස් ප්‍රකාශය තෝරන්න.
(1) කථන සන්නිවේදනය නිරායාසයෙන් සිදු වේ.
(2) ලිඛිත සන්නිවේදනය නිර්මාණාත්මක ක්‍රියාකාරකමකි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනය වර්තමානයේ තාක්ෂණය හා බද්ධව පවතී.
(4) නව මාධ්‍ය තුළ දෘශ්‍ය සන්නිවේදනය ආකර්ෂණීයව භාවිතා කරයි.
(5) වාචික සන්නිවේදනය වචන ශබ්ද නගමින් පමණක් සිදු කරයි.

(39) ශ්‍රී ලංකාව වැනි රටකට අන්තර් සංස්කෘතික අධ්‍යයනය වඩාත් වැදගත් වන්නේ,
(1) තම සංස්කෘතියේ විශිෂ්ටත්වය හඳුනා ගැනීමටය.
(2) සහජීවනයෙන් යුතුව සමාජය තුළ ජීවත් වීමටය.
(3) බහු සංස්කෘතික සමාජයක් ගොඩනගා ගැනීමටය.
(4) සියලු සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටය.
(5) අන්‍ය සංස්කෘතීන් වල වෙනස්කම් හඳුනා ගැනීමටය.

(40) අංග ඡේදනය යනු
(1) මාධ්‍ය සංස්කෘතිය මගින් මිනිසා අන්‍ය සංස්කෘති ආක්‍රමණය කිරීමෙන් වැළකීමකි.
(2) ටෙලි නාට්‍යයක ඇති අනුචිත අංග ඉවත් කිරීමකි.
(3) තාක්ෂණික ක්‍රියාවලියකි.
(4) නිර්මාණාත්මක සන්නිවේදන භාවිතයකි.
(5) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයකි.

(41) යුනෙස්කෝ සංවිධානය පුවත්පත නිර්වචනය කිරීමේ දී ඉදිරිපත් නොකළ ප්‍රකාශයක් වන්නේ මින් කුමක්ද ?
(1) එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු වලින් යුතු බව
(2) නිශ්චිත කාල වකවානුවක ප්‍රකාශ කරන බව
(3) ප්‍රවෘත්ති, ඡායාරූප විශේෂාංග ඇතුළත් බව
(4) අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන බව
(5) එකට නොබඳින ලද ප්‍රකාශනයක් බව

(42) 'ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබළකුගේ භූමිකාව ඉටු කිරීම' ජනමාධ්‍යයේ කාර්ය භාරයකි. මින් අදහස් වන්නේ,
(1) ජන මාධ්‍යයක් මගින් රටක ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන බවයි.
(2) දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක කරන බවයි.
(3) දේශීය සංස්කෘතිය ආරක්ෂා කළ යුතු බවයි.
(4) වංචා, දූෂණ, ආපදා තත්ත්වයන් පිළිබඳව අවදියෙන් සිටි ජනතාව දැනුවත් කර ආරක්ෂා කළ යුතු බවයි.
(5) ජනමාධ්‍ය ආයතන වල ආරක්ෂාවට මුර සෙබළුන් යෙදවිය යුතු බවයි.

(43) කෝලම් නාට්‍ය වල දක්නට ලැබෙන සුවිශේෂීතාවය වන්නේ,
(1) විනෝදාස්වාදය ලබා දීම යි.
(2) උපදේශාත්මක සන්දේශ ලබාදීමයි.
(3) සශ්‍රිකත්වය අරමුණු කරගැනීමයි.
(4) ප්‍රබල සන්නිවේදන අවස්ථා ජනනය කිරීමයි.
(5) වර්ණවත් වෙස්මුහුණු පැළඳීමයි.

(44) ආකර්ෂණීය ජනමාධ්‍ය සංදේශ වලට නතු වීමෙන් වැළකීමට නම් ඔබ වර්ධනය කරගත යුතු නිපුණතාවය වන්නේ,
(1) මාධ්‍ය සාක්ෂරතාවයයි.
(2) මාධ්‍ය විචාරයයි.
(3) පරිකල්පනයයි.
(4) අන්තර්ඥානයයි.
(5) දෘශ්‍ය නිපුණතාවයයි.

(45) සුබෝධි පෙරදින නැරඹූ රූපවාහිනී ටෙලි නාට්‍යයක සිදුවූ සුමිහිරි සිදුවීමක් මනසින් සිහිපත් කරමින් රස වින්දාය. විචාරශීලී ග්‍රාහකයෙකු සතු එම කුසලතාවය,

(1) විශ්ලේෂණයයි. (2) සංස්ලේෂණයයි.
(3) වියුක්තිකරණයයි. (4) කාණ්ඩකරණයයි.
(5) ඇගයීමයි.

(46) රූපවාහිනි මාධ්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) දේශපාලන හා ව්‍යාපාරික අරමුණු මූලික වෙයි.
(2) සමාජ, ආර්ථික, දේශපාලනික ප්‍රවණතා ඇති කරයි.
(3) පුද්ගල දෛනික ජීවන රටාවට බලපෑම් කරයි.
(4) විනෝදාස්වාද සම්පාදන මාධ්‍යයක් ලෙස බිහිවෙයි.
(5) විවිධාකාර අන්තර්ගතයන්ගේ හා ආකෘති වලින් යුතු වෙයි.

(47) පුවත්පතක දැකිය හැකි අර්ථ බාධකයක් වන්නේ,

(1) තීන්ත බොඳවීමයි. (2) ඡායාරූප අපහැදිලි වීමයි .
(3) විරාම ලකුණු, පදබෙදීම අපැහැදිලි වීමයි. (4) වචන මුද්‍රණය නොවීමයි.
(5) උච්චාරණ දෝෂ ඇති වීමයි.

(48) පහත සඳහන් වන්නේ පුවත්පතක පළවූ ශීර්ෂ පාඨ කිහිපයකි,

A - උද්ඝෝෂණයට දාහකට වැඩි පිරිසක්
B - වේගයෙන් පැමිණි බස් රථය වෑන් රථයේ ගැටෙයි
C - වේගයෙන් පැමිණි ත්‍රීරෝද රථය හා කැබ් රථය එකිනෙක ගැටෙයි

ඉහත ප්‍රවෘත්ති අතුරින් පක්ෂග්‍රාහීත්වයෙන් තොරව වාර්තා කර ඇති ප්‍රවෘත්ති ශීර්ෂ පාඨය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C යි
(4) A හා B ය. (5) B හා C ය.

(49) සන්නිවේදන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ,

(1) මාධ්‍ය අධ්‍යයනය විෂයය දරුවන්ට හඳුන්වා දීමයි
(2) මානව අත්දැකීම් වල කේන්ද්‍රීය සාධකය ලෙස සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය හැදෑරීමයි.
(3) ජනමාධ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීමයි.
(4) මාධ්‍ය තාක්ෂණයේ ව්‍යාප්තිය පිළිබඳ හඳුනා ගැනීමයි.
(5) අන්තර් ජාතික වශයෙන් සම්බන්ධතා ගොඩනගා ගැනීමයි.

(50) පහත දැක්වෙන්නේ චමල් නැරඹූ සිනමා පට දෙකක් පිළිබඳ තොරතුරුය

A - සිනමා පටය - සංකේත හා ඉඟි යොදා ගනිමින් ප්‍රේක්ෂක දෑස් සහ දෙසවන් පිනවන නිර්මාණයකි
B - සිනමා පටය - බිය සතුට ආදරය වෛරය කෝපය නිරූපණය කෙරෙන නිර්මාණයකි.

ඉහත නිර්මාණ අධ්‍යයනය කිරීමේදී භාවිතා කළ හැකි මාන පිළිවලින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) සෞන්දර්යාත්මක මාන හා චිත්තවේග මාන
(2) සදාචාරාත්මක මාන හා සෞන්දර්යාත්මක මාන
(3) සංජානන මාන හා චිත්තවේග මාන
(4) සෞන්දර්යාත්මක මාන හා සංජාන මාන
(5) චිත්තවේග මාන හා සෞන්දර්යාත්මක මාන

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

විභාග අංකය: ......................................

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**

**කාලය පැය 03 යි වි. 10**

- උපදෙස් :- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි

01. මානවයා ජීවිතයේ විවිධ අවස්ථාවල සන්නිවේදන වර්ග හා ස්වරූප භාවිතා කරයි

(i) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න. (ල. 04)

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදිය හැකි ආකාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 08)

(iii) වාචික සන්නිවේදනය හා කථන සන්නිවේදනය සමීප බවක් පෙනුණ ද එකිනෙකට වෙනස් වේ. එසේ දක්නට ලැබෙන වෙනස්කම් තුනක් සංසන්දනය කර ලියන්න. (ල. 12)

(iv) ජන සන්නිවේදනය පිළිබඳව ඉදිරිපත් කර ඇති HUB ආකෘතියේ එන පහත මූලිකාංග උදාහරණ මගින් පැහැදිලි කරන්න..

(a) කේත (b) නියාමකයෝ

(c) දොරටුපාලකයෝ (d) මාධ්‍ය විස්තාරය (ල. 16)

02. සන්නිවේදන විකාශනය තුළ විවිධ මාධ්‍ය බිහි විය.

(i) සාම්ප්‍රදායික සමාජය ඇසුරින් බිහි වූ මාධ්‍ය වල සුවිශේෂී ලක්ෂණ හතරක් නම් කරන්න. (ල. 04)

(ii) පළමුවෙන්ම බිහිවූ විද්‍යුත් ජන මාධ්‍යයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) අන්තර්ජාලය පාදක කරගනිමින් බිහිවූ මාධ්‍ය වල ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල. 12)

(iv) පාසල විධිමත් සන්නිවේදන ස්වරූපයක් ක්‍රියාත්මක වන ආයතනයක් බවට තහවුරු කෙරෙන කරුණු හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 16)

03. ජනමාධ්‍ය මගින් මවන මායාකාරී ලොවෙහි යථාර්ථය හඳුනා ගැනීමට විචාරය මග පෙන්වයි.

(i) මාධ්‍ය විචාරය නිර්මාණකරුවාට වැදගත් වීමට බලපාන කරුණු හතරක් නම් කරන්න. (ල. 04)

(ii) ඇතැම් ටෙලි නාට්‍ය හා චිත්‍රපට විචාරයේ දී මනෝ විශ්ලේෂණවාදී විචාරය හා ස්ත්‍රීවාදී විචාරය භාවිතා කිරීමට සිදුවේ.එම විචාර දෘෂ්ටිවාද දෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) මාධ්‍ය සංස්කෘතිය ළමයින් කෙරෙහි බලපෑම් කර ඇති ආකාර තුනක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) පහත සඳහන් ලක්ෂණ මඟින් මාධ්‍ය සංදේශයක් ඵලදායි වන්නේ කෙසේදැයි නිදසුන් මගින් විස්තර කරන්න.

a - සරල ව්‍යුහය b - විශේෂත්වය.

c - ව්‍යුහය d - ඇලීම (ල. 16)

04 සොනාල් සියලු මාධ්‍ය පරිහරණය කරන සක්‍රීය ග්‍රාහකයෙකි

(i) සන්නිවේදනයේ විකාශනය තුළ බිහිවූ මාධ්‍ය ප්‍රධාන ප්‍රභේද හතරක් යටතේ වර්ග කරන්න. (ල. 04)

(ii) සොනාල් ගෝලීකරණයේ බලපෑම්වලට ද ලක් වී ඇත. ගෝලීකරණයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් දක්වන්න. (ල. 08)

(iii) සොනාල්ට මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳ පර්යාලෝකය පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය වන සාධක තුන උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) නූතන මාධ්‍ය පරිහරණය කරන්නකු වශයෙන් සොනාල්ට එයින් ලැබෙන ප්‍රයෝජන හතරක් විස්තර කරන්න. (ල. 16)

05. (i) නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිතා කරන්නෙකු තුළ තිබිය යුතු නිපුණතා හතරක් නම් කරන්න. (ල. 04)

(ii) ලැස්වෙල් ආකෘතියේ විශේෂතා හතරක් නම් කර එකක් විස්තර කරන්න. (ල. 08)

(iii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ල. 12)

(iv) 'ජනකවි තුළින් පිළිබිඹු කරන සන්නිවේදනමය තොරතුරු' මැයෙන් පුවත්පතක් සඳහා වචන 250 කට නොඅඩු ලිපියක් සකස් කරන්න. (ල. 16)

06. සන්නිවේදනයේ විකාශනය සංස්කෘතියේ විකාශනයට ද හේතු විය.

(i) බී මැලිනොව්ස්කි ගේ නිර්වචනය තුළ දක්වා ඇති සංස්කෘතියට අයත් අංග හතරක් නම් කරන්න. (ල. 04)

(ii) 'සංස්කෘතිය යනු ප්‍රකෘතියේ විකෘතියයි 'ප්‍රකෘතිය හා විකෘතිය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) මාධ්‍ය සංස්කෘතිය විසින් සමාජයට ඉටු කරන කාර්යයන් තුනක් විස්තර කරන්න (ල. 12)

(iv) මාධ්‍ය ආයතන හිමිකාරීත්වය මාධ්‍ය සංදේශ කෙරෙහි ඍජුවම බලපායි. එබැවින් සංදේශ වල යථා ස්වභාවය හඳුනා ගැනීම සඳහා ඒවා මනා ලෙස විශ්ලේෂණය කර ගත යුතුය. මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් විස්තර කරන්න. (ල. 16)

07. (i) ශාන්ති කර්ම කිරීමෙන් සාම්ප්‍රදායික සමාජයේ මිනිසා අපේක්ෂා කළ අරමුණු හතරක් නම් කරන්න. (ල. 04)

(ii) සඟරාවක ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

(iii) පුවත්පත් මාධ්‍ය හරහා විනෝදාස්වාද සම්පාදනය කරන ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 12)

(iv) එක්තරා රූපවාහිනී නාලිකාවක් මගින් සඳගිරි පාසලේ දරුවන්ගේ මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමේ අරමුණින් වැඩමුළුවක් පවත්වන ලදී. මෙම අවස්ථා ඇසුරෙන් නිදසුන් යොදාගනිමින් සන්නිවේදන මූලිකාංග හතරක් විස්තර කරන්න. (ල. 16)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය - 2023

12 ශ්‍රේණිය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(3) | 4 -(5) | 5 -(2) | 6 -(1) | 7 -(2) | 8 -(1) | 9 -(4) | 10 -(1) |
| 11 -(1) | 12 -(4) | 13 -(3) | 14 -(5) | 15 -(1) | 16 -(5) | 17 -(3) | 18 -(2) | 19 -(3) | 20 -(2) |
| 21 -(4) | 22 -(4) | 23 -(5) | 24 -(1) | 25 -(1) | 26 -(2) | 27 -(3) | 28 -(2) | 29 -(5) | 30 -(5) |
| 31 -(4) | 32 -(2) | 33 -(1) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(4) | 38 -(5) | 39 -(2) | 40 -(1) |
| 41 -(3) | 42 -(4) | 43 -(5) | 44 -(1) | 45 -(3) | 46 -(4) | 47 -(3) | 48 -(3) | 49 -(2) | 50 -(1) |

(ල.01×50=50)

## II කොටස

01. (i) කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගත හැකිවීම/ ප්‍රස්තුත කරුණු පිළිබඳ තවදුරටත් දැනුවත් කළ හැකි වීම/ ප්‍රතිරූප ගොඩ නංවා ගත හැකි වීම/ කිසියම් මතයක් නිර්මාණය කළ හැකි වීම/ විවිධ පාර්ශවවල අවධානය දිනා ගත හැකි වීම (ල.01×04=04)

(ii) අභිමුඛව (මුහුණට මුහුණලා)/ අනභිමුඛව මාධ්‍ය (උපකරණ හරහා) (ල.04×02=08)

(iii)
- ⋆ වාචික සන්නිවේදනය වචන ශබ්ද නගමින් මෙන්ම ලිඛිතව ද භාවිතා කරයි. කථන සන්නිවේදනය මුවින් පිටවන වදන් වලට පමණක් සීමා වේ.
- ⋆ වාචික සන්නිවේදනය සැලසුම් සහගතව සිදු වේ. කථන සන්නිවේදනය නිරායාසයෙන් ස්වාභාවිකව සිදුවේ.
- ⋆ වාචික සන්නිවේදනය ඇතැම් අයට අවබෝධ කරගැනීම අපහසු වුවද කථන සන්නිවේදනය අවබෝධ කරගැනීම අපහසු වේ.
- ⋆ වාචික සන්නිවේදනයට වඩා කථන සන්නිවේදනයේ දී නිර්වාචික සන්නිවේදනයේ උපකාරීත්වය වඩාත් හොඳින් ලබාගත හැකිවේ. (ල.04×03=12)

(සංසන්දනය කර තිබිය යුතුයි)

(iv) a කේත - සංදේශයක් ගමන් කළ හැකි දෙයක් බවට පත් කිරීම සඳහා යොදා ගන්නා බහුවිධ සංඥා සංකේත වේ. උදා: වචන, අකුරු, රූප, හඬ, වර්ණ, සංගීතය ආදිය

b නියාමකයෝ - මාධ්‍ය ආයතනයක බාහිරව සිට මාධ්‍ය කටයුතු පාලනය කරන ආයතන හා පුද්ගලයන් වේ
උදා: රාජ්‍ය කොමිසන් සභා, උසාවි, වෘත්තීය සංවිධාන, බහුජාතික සමාගම්, දැන්වීම්කරුවන් ආදිය

c දොරටුපාලකයෝ - මාධ්‍ය ආයතනයක් තුළ සිට සංදේශ පාලනය කරන අය වේ
උදා: ආයතන හිමියන්, සංස්කාරක කර්තෘ, උප කර්තෘ ආදිය

d මාධ්‍ය විස්තාරය - කිසියම් කරුණක් සම්බන්ධයෙන් මාධ්‍ය වැඩි අවධාරිත බලයක් යොමු කිරීමයි
මෙය කාලීනව වෙනස් වේ
උදා: කොවිඩ් 19 සමයෙහි මාධ්‍ය සන්දේශ සකස් කිරීමේදී ඒ කෙරෙහි වැඩි අවධාරිත බලයක් යොමු කිරීම ආදී උදාහරණ (විස්තර කිරීමට ල. 3 x 4 = ල. 12, උදාහරණ ල. 1 x 4 = ල. 4, මුළු ලකුණු 16)

02. (i) සරල ව්‍යුහය/ තේමාත්මක අන්තර්ගතය/ නම්‍යශීලීත්වය/ සංස්කෘතික සන්දර්භය /අවම පිරිවැය (ල.01×04=04)

(ii) තාක්ෂණික මාධ්‍යයක් වීම/ පුළුල් කලාපයක් ආවරණය කිරීම/ එක් දිශාවකට සංදේශ ගමන් කිරීම/ සරල ජංගම මාධ්‍යයක් වීම/එක් එක් ග්‍රාහක කොටස් ඉලක්ක කර ගනිමින් ඉදිරිපත් කළ හැකිවීම/ පරිකල්පනීය මාධ්‍යයක් වීම/ අඩු පිරිවැය සහිත මාධ්‍යයක් වීම (ලකුණු 4 x 2 = 8)

(iii) අංකිතකරණය/ ජාලගතකරණය/ අන්තර් ක්‍රියාකාරීත්වය/ අධිපාඨනීයත්වය/ ස්වයංකරණය/ දත්ත සංචිත කරණය/ වේගවත් සංදේශ ගතකරණය (ලකුණු 4 x 3 = 12)

(iv) මෙහෙයවන්නෙක් සිටීම/ නිශ්චිත අරමුණු පැවතීම/ සැලසුම් සහගත වීම/ නිශ්චිත ධූර වලියක් පැවතීම/නිශ්චිත කාලයක් ස්ථානයක් පැවතීම/ නිල ස්වභාවයක් පැවතීම ආදී කරුණු (ලකුණු 4 x 4 = 16)

03. (i) සන්දේශයේ ප්‍රබලතා දුබලතා හඳුනාගත හැකි වීම/ නව නිර්මාණ බිහි කිරීමට මග පෙන්වීම/ සමාජ අවශ්‍යතා අනුව නිර්මාණ දිශානුගත කිරීමට/ නිර්මාණකරුවාට තම නිර්මාණය පුළුල්ව විමර්ශනය කර ගැනීමට/ නිර්මාණයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වූවා ද යන්න දැන ගත හැකි වීම.

(ලකුණු 1 x 4 = ල. 4)

(ii) මනෝ විශ්ලේෂණවාදී විචාරය - මනෝ විද්‍යාව පදනම් කරගනිමින් මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කරන බවත් මාධ්‍ය සංදේශ හරහා ග්‍රාහක මනසට බලපෑම් කරන ආකාරයත් පිළිබඳව විස්තර කළ යුතුය.

ස්ත්‍රීවාදී විචාරය - ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිමින් මාධ්‍ය සන්දේශ විචාරය කරන ආකාරය විස්තර කළ යුතුය. (ලකුණු 4 x 2 = ල. 8)

(iii) දෛනික ජීවිතයට/ ආකල්ප වලට /හැසිරීම් වලට /රසවින්දනයට/ ප්‍රචණ්ඩත්වයට /පරිභෝජනයට ආදී කරුණු තුනක්උදාහරණ සහිතව විස්තර කළ යුතු. (ලකුණු 4 x 3 = ල. 12)

(iv) මාධ්‍ය සන්දේශයක් ඵලදායි වීමට සංදේශයක සරල බව, සුවිශේෂී බව, ව්‍යුහය හා සන්දේශය කෙරෙහි ඇලීමට බලපාන හේතු ආදී කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (විස්තර කිරීමට ල 4 x 3 = ල. 12)

(උදාහරණ දැක්වීමට ල 1 x 4 = ල. 4)

04 (i) සාම්ප්‍රදායික මාධ්‍ය /ජනමාධ්‍ය(නූතන මාධ්‍ය)/ නව මාධ්‍ය/ සමාජ මාධ්‍ය (ලකුණු 1 x 4 = ල. 4)

(ii) ගෝලීය උපරි සමාජයේ අනුදැනුම මත ක්‍රියාත්මක වීම/ සියලු ජාතික වාර්ගික සංස්කෘතීන් විනාශ වීම/ සම්ප්‍රදායික, ජන හා ජාතික සංස්කෘතීන්වලට විරුද්ධව ක්‍රියාත්මක වීම/ සියලුම ජාතික සංස්කෘතීන් ඒකාකාර වීම හා සමජාතීකරණය වීම. (ලකුණු 4 x 2 = ල. 8)

(iii) ස්ව කේන්ද්‍රය(ස්ව පථය) / ඥාන ව්‍යුහය/ කුසලතා උදාහරණ සහිතව විස්තර කළ යුතුයි

(නම් කිරීමට ල. 1 x 3 = ල. 3)

(විස්තර කිරීමට ල. 3 x 3 = ල. 9)

(මුළු ලකුණු =12)

(iv) ප්‍රජානනය (දැනුම ලබාගැනීම)/ අපසරණය (විකල්ප වෙත යොමුවීම)/ සමාජ උපයෝගීතාව (සමාජ අවශ්‍යතා ඉටු කිරීම)/නිෂ්කරණය (පුද්ගලයන්ගෙන් හා කාර්යයන්ගෙන් ඉවත් වී සිටීම)යන කරුණු විස්තර කළ යුතුය (නම් කිරීමට 1 x 4 =4)

(විස්තර කිරීමට 3 x 4 = 12)

(මුළු ලකුණු =16)

05. (i) රූපයක් අවගත (Download) කරගැනීම /මාර්ගගත කතාවක පෙළට සබැඳියක් එකතු කර ගැනීම/ වෙබ් පිටුවකින් වෙබ්, ලිපියකින් වීඩියෝවක් බාගත කර තවදුරටත් තොරතුරු එක් කර ගනිමින් නැවත ප්‍රතිනිර්මාණය කිරීම/ කතාවකට අදාල සබැඳි සොයා ඒවා ඊට එකතු කිරීම/ විද්‍යුත් තැපැල හරහා ලිපි යැවීම ආදී කරුණු. (ලකුණු1x 4 = 4)

(ii) රේඛීය හා එක මාර්ගිකවීම/ සන්නිවේදකයාට මූලිකස්ථානයත් ග්‍රාහකයාට ද්විතීයික ස්ථානයත් හිමි වීම/ සන්නිවේදන බාධක, ප්‍රතිපෝෂණය ආදිය දක්වා නොමැති වීම/ මූලිකාංග පහක් කෙරෙහි අවධානය යොමු කිරීම/ බලපෑම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබීම.

(නම් කිරීමට ල. 1 x 4 = ල. 4)

(විස්තර කිරීමට ල. =4)

(මුළු ලකුණු =8)

(iii) සන්නිවේදන කුසලතා වර්ධනය වීම/ මාධ්‍ය සාක්ෂරතාව ඇතිවීම/ නිර්මාණශීලී සන්නිවේදන කුසලතා වර්ධනය වීම/ විචාරශීලීව මාධ්‍යය පරිහරණය කළ හැකි වීම/ මාධ්‍ය මගින් පුද්ගලයාට කරන බලපෑම හඳුනාගත හැකිවීම/ මාධ්‍ය ආචාරධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධයක් ලැබීම ආදිය

(ලකුණු 4×3 =12 )

(iv) ජන කවිය තුළින් එකල පැවති ආර්ථික, සමාජීය, සංස්කෘතික, ආගමික තොරතුරු නියෝජනය කළ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය. (ලකුණු4 x 4 =16)

06. (i) උපකරණ/ පාරිභෝගික ද්‍රව්‍ය /විවිධ සමාජයීය සමූහයන් ගේ ව්‍යූහමය ලක්ෂණ/ මානව සංකල්පනා/ ශිල්ප/ විශ්වාසය හා චාරිත්‍ර. (ලකුණු 1 x4 = ල. 4)

(ii) සංස්කෘතියේ ප්‍රකෘතිය යනු නියම ස්වභාවයයි.උදා: නිරුවත්ව ජීවත් වීම සතුන් මරා අමු මස් ආහාරයට ගැනීම ලිංගික අවශ්‍යතා එක් අයෙකුට පමණක් සීමා නොවීම ආදිය

විකෘතිය යනු මානව පරිණාමයත් සමඟ පැවැති තත්ත්වය වෙනස් කරගනිමින් නිර්මාණය කරගත් දේ වේ

උදා: ඇඳුම් පැළඳුම් විවිධ උපකරණ නිෂ්පාදනය ආචාර ධර්ම ඇති කර ගැනීම ආදිය

(ලකුණු 4 x 2 = ල. 8)

(iii) විඥපන (තොරතුරු) කාර්ය, සන්නිවේදනාත්මක කාර්ය දෘෂ්ටිවාදී කාර්ය, ප්‍රතිෂ්ඨාපන කාර්ය, නිර්මාණාත්මක කාර්යය, අනුකලනාත්මක කාර්යය, අතරමැදි කාර්යය ආදිය (ලකුණු 4×3 = ල. 12 )

(iv) අර්ථය, අදාළ බව, පෙළඹවීම, අපක්ෂපාතී බව, විශ්වසනීය බව, විකෘතිකරණය, සඵලතාවය, ගුරුමෙහෙයවීම, ඒකාකෘතිකභාවය, ඇගයීම යනාදී කරුණු (ලකුණු 4×4 = ල. 16 )

07. (I) ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීම/ සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කිරීම/ බෝ වන රෝග වලින් ආරක්ෂා වීම/ අපල උපද්‍රවවලින් අත්මිදීම/ විනෝදාස්වාදය ලබා ගැනීම ආදිය. (ලකුණු 1 x 4 = ල. 4)

(ii) නිශ්චිත කාල වකවානුවක් තුළ පලකිරීම (සතිපතා,මාසිකව ආදී වශයෙන් )/කෙටි ලිපි රූපසටහන් අන්තර්ගත වීම/ කලාව, ආගම, ක්‍රීඩා, කෘෂිකර්මය, විද්‍යාව, සංස්කෘතික ආදී තේමා යටතේ පළ කිරීම/ සංස්කාරක මණ්ඩලයක් හරහා සිදු කිරීම/එකට බඳින ලද ප්‍රකාශනයක් වීම ආදිය. (ලකුණු 4 x 2 = ල. 8)

(iii) කෙටි කතා, නවකතා වල කොටස් පල කිරීම හරහා/ කාටූන් හරහා/ චිත්‍රකතා හරහා/ ප්‍රහේලිකා පිරවීම ආදිය හරහා (ලකුණු 4 x 3 = ල. 12)

(iv) සන්නිවේදකයා, ග්‍රාහකයා, මාධ්‍ය, සංදේශය, බලපෑම, බාධක, ප්‍රතිපෝෂණය, ආකේතකරණය, විකේතකරණය, අත්දැකීම් පසුතලය, සන්දර්භය ආදී මූලිකාංග හතරක් නම් කර එම අවස්ථාව ඇසුරින් උදාහරණ දක්වා විස්තර කළ යුතුය (විස්තර කිරීමට 3 x 4 = ල. 12)

(උදාහරණ දැක්වීමට 1 x 4 = 4)

(මුළු ලකුණු =16)